**කලවාන ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 20 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු අක්කර බදු රු. 16,799 කින් වැඩියෙන් දක්වා තිබුණි. | හිඟ අක්කර බදු ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 41,657 ක ණයහිමි අධි වෙන්කිරීම සිදුකර තිබුණි. | වර්ෂය අවසානයට ණයහිමි ශේෂය නිවැරදිව දැක්විය යුතුවේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) | දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කරන ලද රු. 18,210 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ගෙවීමක් ලෙස සටහන් කර තිබීම නිසා ගෙවිය යුතු ණය ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. ශේෂ තහවුරු කිරීම් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂයෙහි රු. 1,411,932 ක වෙනසක් පැවතුණි. | අදාල ගැලපීම් සිදුකර නිවැරදි ණය ශේෂය ගිණුම්ගත කළ යුතවේ. | ලේඛන පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 13 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 23,634,314 ක වෙනසක් විය. | අදාල වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | එකතුව රු. 273,361 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සංනිරීක්ෂණය කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | මෙම ගිණුම් සම්බන්ධ විස්තර සොයාබලා ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 260 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,041,023 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම - | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,385,155 | 3,257,175 | 3,523,564 | 3,187,549 | 3,927,856 | 3,043,821 | 3,194,633 | 3,903,524 |
| (ii) | කුලී | 3,200,250 | 5,299,846 | 5,132,945 | 5,108,105 | 6,317,300 | 4,016,018 | 4,067,850 | 5,082,076 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 528,680 | 481,940 | 481,940 | - | 3,372,051 | 542,185 | 471,185 | - |
| (iv) | වෙනත් ආදායම් | 37,491,818 | 30,628,384 | 34,899,166 | 13,893,730 | 9,218,437 | 8,583,336 | 1,510,087 | 16,536,420 |

#### 2.2.2 වරිපනම් හා බදු

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 1,853,538 ක් වූ අතර, ඒ තුල වසර 05 කට වඩා වැඩි වරිපනම් ඒකක 74 කින් රු. 661,493 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා නව වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ අක්කර බදු ශේෂය රු. 486,951 ක් වූ අතර, ඒ තුල වසර 05 ට වඩා වැඩි ඒකක 187 කින් අයවිය යුතු රු.156,631 ක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ වනවිට ආදායම් පරීක්ෂක නිලධාරීන් අක්කර බදු සතොයක්ෂණයක් සිදු කරමින් පවතී. එම සත්යෙක්ෂණය අනුව හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 මාර්තු 09 දිනැති හා අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයේ 1.5 උප වගන්තියට පටහැනිව නව ගොඩනැගිල්ලේ කඩකාමර වල බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. තවද, කඩකාමර වලින් අඩු කුලියක් අයකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී කඩකාමර 20 කින් රු. 188,100 ක් අඩුවෙන් කඩකුලී අයකර තිබුණි. | වර්ෂ 05 කට වරක් කඩකුලිය තක්සේරු කර නව වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පොදු වෙළඳපළ කඩකාමර කඩ කුලී සංශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. නව තක්සේරුව ලද වහාම කඩ කුලී සංශෝධනය කර අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2007 වර්ෂයෙන් පසුව පැරණි පොදු වෙළඳපල කඩකාමර 16 ක් සඳහා කඩ කුලිය සංශෝධනය කර නොතිබුණු අතර, විධිමත් ගිවිසුම් වලින් තොරව ලබාදී තිබුණු කඩහිමියන්ගෙන් ලබාගෙන තිබුණු එක්වන් මුදල් පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කඩකාමර තක්සේරු කර විධිමත් පරිදි ගිවිසුම්ගත විය යුතුවේ. | පෙර ගෙවු මුදල් පිළිබඳ තොරතුරු සොයා බලා ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙම කඩකාමර සඳහා නව තක්සේරුවක් ලබාගෙන ඒ අනුව මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 02 කින් ආදායමින් සියයට 01 ක ගාස්තුව අය කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සංචාරක හෝටල් හඳුනාගෙන ඇති අතර ඉන් එක් ආයතනයකින් සියයට 01 ක ගාස්තුව අයකර ගෙන ඇත. අනෙකුත් ආයතන සඳහා සියයට 01 ගාස්තු ලබා ගැනීම සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇත. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට සභාව වෙත ලැබිය යුතුව පැවති | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා නියමිත උසාවි දඩ උපලේඛන සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. 2018 වර්ෂයේ අවසන් මාස 04 සඳහා ලැබිය |

| | | |
|---|---|---|
| උසාවි දඩ රු. 972,292 ක් විය. | | යුතු උසාවි දඩ මුදල් මූල්‍ය ප්‍රකාශන සකස් කරන දිනය වන විටද ලැබී නොමැත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ලඟා කර ගැනීමට අපේක්ෂිත දීර්ඝකාලීන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන සිව් අවුරුදු සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්මෙහි අදාල කාල රාමුව තුල උප ක්‍රියාකාරකම් යටතේ රැස් කිරීමට අපේක්ෂිත ආදායම හා සංවර්ධන උප ක්‍රියාකාරකම් යටතේ සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 04 තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කර්මාන්ත නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා විධිමත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා සිව් අවුරුදු සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කරමින් 2019 වර්ෂයේ දී සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමට කටයුතු කරමි. |

**(ආ)** **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මඟින් වෙන්කර තිබුණු රු. 15,950,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 25 ක් ප්‍රමාණවත් මුදල් නොලැබීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අයවැයගත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට සභාව කටයුතු කළ යුතුවේ. | සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ලැබී නොතිබුණි. |
| (ii) | බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව ඉදිරිපත් කර තිබුණු ජනතා ඉල්ලීම් 14 ක් සඳහා මුදල් ප්‍රමාද වී ලැබීම නිසා ක්‍රියාත්මක කිරීමට සභාව | ප්‍රදේශයේ සිදුකළ යුතු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ජනතා ඉල්ලීම් ඉටු කිරීම කෙරෙහි | ලැබිය යුතු මුද්දර ගාස්තු 2018 වර්ෂයේ අවසාන මාසයේදී ලැබීම නිසා කර්මාන්ත සිදු කිරීම සඳහා |

| | | |
|---|---|---|
| අපොහොසත් වී තිබුණි. | සභාව වැඩි අවධානයක් යොමු කළ යුතුවේ. | ප්‍රමාණවත් කාලයක් නොවීය. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොකර සභාව විසින් රැස් කරන දිරන කසළ බැහැර කිරීම සඳහා වලවල් කැපීමට සමාලෝචිත වර්ෂයේදී රු. 288,237 ක වියදමක් දරා තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් හා කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු සකස් කර පරිසර අමාත්‍යාංශයේ පිළිසරු ව්‍යාපෘතියට ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලද විගස ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුගත වෙමින් දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | මේ වනවිට සභා බල ප්‍රදේශය තුළ මහජනතාවගේ තිරසර සංවර්ධනය සඳහා, අරමුණු 03 ක් යටතේ වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත. ඉතිරි සංවර්ධන අරමුණු 14 සඳහා ද ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් පස් දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 41,954 ක් විය. | හිඟ ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල ගෙවන ලෙසට ලිඛිතව දැනුම් දී ඇත. |

## 3.3 ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොතුපිටිය විද්‍යාලයේ වොලිබෝල් පිටිය වටා දැල ගසා ආවරණය කිරීම හා විදුලිය ලබා ගැනීම සඳහා ලබාදී තිබුණු රු. 194,895 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ක්‍රීඩාපිටියෙහි එක් පැත්තක දැලක් යොදා ආවරණය කර තිබුණි. ක්‍රීඩාපිටියට විදුලිය ලබා ගැනීමද සිදුකර නොතිබුණු බැවින් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි. | කර්මාන්තයෙන් ලබා කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | අදාල කර්මාන්තයේ නම ලෙස "පොතුපිටිය විද්‍යාලයේ වොලිබෝල් ක්‍රීඩාපිටිය වටා දැල් ගසා සකස් කිරීම හා විදුලිය ලබාදීම" ලෙස නම් කර අපවෙත ව්‍යාපෘති අධීක්ෂණය සඳහා භාර දී තිබුණද, ඒ සඳහා වෙන් කර තිබූ මුදල රු. 200,000 කි. එම මුදල ප්‍රමාණවත් නොවූ බැවින් ලබා දී ඇති මුදලෙන් එම විද්‍යාලයේ විදුහල්පති තුමාගේ ඉල්ලීම පරිදි එක් පැත්තක පමණක් දැල් ගසන ලදී. |
| (ආ) | මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්ත 06 කට අදාලව හා ගඟලගමුව ක්‍රීඩාංගනය ආලෝකකරණය කිරීම කර්මාන්තයේ වැඩ විෂයයන් 03 කට අදාලව රු. 43,554 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | උක්ත කර්මාන්ත වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති බව සඳහන් කර ඇති රු. 39,185 ක් රඳවුම් මුදල් වලින් අයකර ගැනීම හා ඉතිරි මුදල වන රු. 4,369 ක් අදාල සමිතියෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 20 කට අදාලව එකතුව රු. 8,065,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගතව ප්‍රතිපාදන වෙන් කල යුතු අතර, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | ගෙවීම් වවුචර් පිළියෙළ කිරීමේදී එහි වැය ශීර්ෂය නිවැරදිව සටහන් නොකිරීම ද 2018 වර්ෂයේ මන්ත්‍රී මණ්ඩලය පත්වීම අප්‍රේල් මාසයේදී සිදුවීම ද වැය ශීර්ෂවල ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 15 කට අදාලව එකතුව රු.6,524,400 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 41 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගතව ප්‍රතිපාදන වෙන් කල යුතු අතර, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | 2018 වර්ෂයේ නව මන්ත්‍රී මණ්ඩලය පත්වීම සිදු වූයේ අප්‍රේල් මාසයේදී වන බැවින් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන මාස 04 ක් පමණ අඩුවෙන් වියදම් වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම සිදු වී ඇත. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සඳහා විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර පවත්වාගෙන යා යුතුවේ. | 2019 වර්ෂය සඳහා නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබයි. |